. .

# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2023

2025 සැප්තැම්බර් / ඔක්තෝබර්

මානවශාස්ත්‍ර පීඨය

## බෞද්ධ දර්ශනය

(නව නිර්දේශය)

**බෞද්ධ ආචාරධර්ම හා බෞද්ධ සමාජ දර්ශනය - BUPH 28224**

ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. බෞද්ධ ආචාරධර්මවලට අයත් විෂය පරාසය කෙටියෙන් හඳුන්වා, සූත්‍රාගත ඇගයුම්ශීලී ප්‍රකාශන පිළිබඳ ගවේෂණයක යෙදෙන්න.

02. ''පාලි නිකායාගත ඇතැම් බුද්ධ දේශනා ආචාර ධර්ම විනිශ්චයෙහි ලා නිර්ණායක ලෙස උපයෝගී කරගත හැකිය.'' මූලාශ්‍රය ඇසුරෙන් සාකච්ඡා කරන්න.

03. බුද්ධකාලීන භාරතීය අන්‍ය ලබ්ධික ආචාරධර්මවලට සාපේක්ෂව බෞද්ධ ආචාරධර්මවල විශේෂ ලක්ෂණ පෙන්වා දෙන්න.

04. 'ස්වච්ඡන්දතාව' යන්න නිර්වචනය කොට ක්‍රියාවක් විෂයයෙහි ස්වච්ඡන්දතාවක් අවශ්‍ය වන්නේ කවර හෙයින් දැයි පැහැදිලි කරන්න.

05. 'කුසල' යන පදයෙන් නියෝජනය වන බෞද්ධ ආචාරධර්ම දුක්ඛ නිරෝධය අරමුණු කොට ඇති අයුරු විශද කරන්න.

06. දේව නිර්මාණවාදී බ්‍රාහ්මණ සමාජ ධර්මවල නිස්සාරත්වය නිරාවරණය කිරීමේදී, සමාජ ශෝධකයකුගේ භූමිකාව බුද්ධ චරිතයෙන් ප්‍රකට වන්නේදැයි පරීක්ෂා කරන්න.

07. 'පරාර්ථකාමීත්වය බෞද්ධ දේශපාලනය ඉගැන්වීම්වල මූලික සිද්ධාන්තයකි' මූලාශ්‍රය නයින් සාකච්ඡා කරන්න.

08. විවාහ ජීවිතය ආශ්‍රිත ගැටලු නිර්මාණය වීමෙහිලා බලපාන හේතු සාධක කෙටියෙන් දක්වා, තෘප්තිමත් විවාහ ජීවිතයකට බෞද්ධ ඉගැන්වීම්වලින් ලැබිය හැකි පිටිවහල ප්‍රමාණ කරන්න.

09. ගිහි-පැවිදි සම්බන්ධතා පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් උභය පක්ෂයේම යහපැවැත්මට හේතුවන අයුරු පෙන්වා දෙන්න.

10. ධන පරිභෝජනයට අදාළ බුද්ධ දේශනා සමාජ සහජීවනයට ඉවහල්වන අයුරු මූලාශ්‍රය ඇසුරෙන් පැහැදිලි කරන්න.

*******************************